–

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,357 - 2023 නොවැම්බර් මස 03 වැනි සිකුරාදා - 2023.11.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1520 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1537 |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 නොවැම්බර් මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 නොවැම්බර් මස 10 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1519- B 82511— 5,403 (2023/11)

**රිදීගම ප්‍රාදේශීය සභාව**

**දැන්වීමයි**

2024 වර්ෂයේ රිදීගම ප්‍රාදේශීය සභාවේ කෙටුම්පත් අයවැය ලේඛනය පහත සඳහන් ස්ථානවල දී පරීක්ෂා කර බැලීමට මහජනතාවට අවස්ථාව සලසා ඇති බව මෙයින් දනුම් දෙනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය | - | රිදීගම |
| 02. | ප්‍රාදේශීය සභා උප කාර්යාලය | - | දොඩම්ගස්ලන්ද/හේවාවිස්ස |
| 03. | මහජන පුස්තකාලය | - | දොඩම්ගස්ලන්ද/රම්බඩගල්ල/හේවාවිස්ස |

ලේකම්,
රිදීගම ප්‍රාදේශීය සභාව,

2023 නොවැම්බර් මස 01 වැනි දින.

11-181

---

**ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය**

දියුණුකළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 134 (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 27 දින තීරණ අංක 2023/09/27/136 යටතේ ගෙන ඇති පහත සඳහන් තීරණයට එකී පනතේ 134(1) උපවගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්/නියොජ්‍ය පළාත් පාලන කොමසාරිස් ලෙස කටයුතු කරනු ලබන සංදීපනී නිල්මිණී දම්මුල්ලගේ වන මවිසින් අනුමැතිය දෙන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංදීපනී නිල්මිණී දම්මුල්ලගේ,
පළාත් පාලන සහකාර කොමසාරිස් - ගාල්ල,

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි 223 ඇත්කඳුර ග්‍රාම නිලධාරී කොට්ඨාශය, 223 බී තණබද්දේගම ග්‍රාම නිලධාරී කොට්ඨාශය, 223 සී පරණ ජනපදය ග්‍රාම නිළධාරී කොට්ඨාශය, 192 අම්පේගම ග්‍රාම නිලධාරි කොට්ඨාශය හා 192 ඒ ගලහේන්කන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාශය යන ග්‍රාම නිලධාරි කොට්ඨාශවලින් සමන්විත ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශයන් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත්, ඒ සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමටත් තීරණය කරමි.

11-20/1

---

**ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය**

දියුණුකළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 134 (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව ඉමදූව ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2023 වර්ෂයේ ඔක්තෝබර් මස 04 වැනි දින තීරණ අංක 2023/10/04/149 යටතේ ගෙන ඇති පහත සඳහන් තීරණයට එකී පනතේ 134(1) උපවගන්තියෙන් පළාත් පාලන සහකාර

කොමසාරිස්/නියොජ්‍ය පළාත් පාලන කොමසාරිස් ලෙස කටයුතු කරනු ලබන සංදීපනී නිල්මිණී දම්මුල්ලගේ වන මවිසින් අනුමැතිය දෙන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංදීපනී නිල්මිණී දම්මුල්ලගේ,
පළාත් පාලන සහකාර කොමසාරිස් - ගාල්ල,

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව, ඉමදුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ විස්තර කර ඇති ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත්, ඒ සඳහා ගාල්ල දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමටත් ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව තීරණය කරමි.

*උපලේඛනය*

| *අනු. අංකය* | *කොට්ඨාස අංකය* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසය* |
|---|---|---|
| 1 | 153 | දොරපේ |
| 2 | 153 C | වැලිකොන්ද |
| 3 | 153 B | රංගොඩ |
| 4 | 154 | අඟුළුගහ |
| 5 | 154 C | පැලවත්ත |
| 6 | 175 | හව්පේ |
| 7 | 175 B | හව්පේ උතුර |
| 8 | 173 C | වතවන |
| 9 | 173 | පරගොඩ |
| 10 | 173 B | දීගොඩ අතිරේක |
| 11 | 172 A | ඉමදූව අතිරේක |
| 12 | 172 | ඉමදූව |
| 13 | 169 A | හෙට්ටිගොඩ |
| 14 | 171 A | කෝදාගොඩ නැගෙනහිර |
| 15 | 169 | කෝදාගොඩ දකුණ |
| 16 | 168 | හොරදූගොඩ |
| 17 | 171 | මලල්ගොඩපිටිය |
| 18 | 165 | දික්කුඹුර |
| 19 | 170 | අන්දුගොඩ |
| 20 | 170 A | ඇල්ලලගොඩ |

11-20/2

---

**ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය**

දියුණුකළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 134 (1) උපවගන්තියෙන් නියාගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ ඔක්තෝබර් මස දස වන දින තීරණ අංක 2023/10/10/162 යටතේ තීරණය කෙරුණු පහත සඳහන් තීරණයට එකී පනතේ 134(1) උපවගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරින් වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරනු ලබන සංදීපනී නිල්මිණී දම්මුල්ලගේ නමැති ම විසින් අනුමැතිය දෙන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංදීපනී නිල්මිණී දම්මුල්ලගේ,
පළාත් පාලන සහකාර කොමසාරිස්/
නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් - ගාල්ල.

2023 ඔක්තෝබර් මස 16 වැනි දින,
ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

**ඉහත කී තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව, නියාගම ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල අනුව, නියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි 37 ඒ 2 මානම්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා 38 නියාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය යන ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත්, ඒ සඳහා ගාල්ල දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමටත් උක්ත ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව තීරණය කරමි.

11-20/3

---

**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

**විරෝධතා කැඳවීමයි**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් පහතින් සඳහන් කරන පිඹුරු අංක 100 යටතේ සඳහන් කොට ඇති මංමාවත කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මාවතට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වකරුවන් ගෙන් හෝ යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය පළ වූ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (3) වගන්තිය යටතේ උපලේඛන අංක 01 හි සඳහන් මාංමාවත කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එස්. ආර්. අතාවුද,
ලේකම්,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව,
මැණික්හින්න.

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව,
මැණික්හින්න.

*උපලේඛන අංක 01*

01. මාර්ගයේ නම - ගෝනවල මංසංදියේ සිට දොඩංගොල්ල සහ ගෝනවල උතුර උඩගම්මැද්ද හරහා ප්‍රධාන මාර්ගයට වැටී ඇති මාර්ගය
02. ආරම්භය - ප්‍රධාන මාර්ගයේ සිට නාරම්පනාව දක්වා දිවෙන මාර්ගයේ ආරම්භය.
03. අවසානය - දිගන තෙල්දෙණිය ප්‍රධාන මාර්ගය
04. ග්‍රාම නිලධාරි වසම - ගෝනවල උතුර
06. පිඹුරු අංකය - 100

ගෝනවල මංසංදියේ සිට දොඩංගොල්ල සහ ගෝනවෙල උතුර උඩගම්මැද්ද හරහා ප්‍රධාන මාර්ගයට වැටී ඇති මාර්ගය

| *වම්පස ඉඩම් හිමියන්ගේ නම්* | *දකුණුපස ඉඩම් හිමියන්ගේ නම්* | *දිග* | *පළල* | *මාර්ග සිතියම අදාළ පිඹුරුපත් අංකය* |
|---|---|---|---|---|
| 1. ටී. ජී. සමරකෝන් බණ්ඩා මයා<br>2. ශ්‍රී සුදර්ශනාරාමය සතු ඉඩම<br>3. ස්ටේට් ගාර්ඩින් සතු ඉඩම<br>4. කේ. ජී. චන්ද්‍රාවතී මිය<br>5. පී. ඩී. වීරකෝන් මයා<br>6. ඩබ්. ඒ. ජී. රණසිංහ මයා<br>7. කේ. ඩබ්. ජේ. මදනායක මයා | 1. චන්ද්‍රාවතී මිය<br>2. කේ. ජී. ලොකුමැණිකේ මිය<br>3. ජී. ජී. වීරසිංහ මයා<br>4. ජී. ජී. රොස්ලින් නානා මයා<br>5. එස්. එම්. ඒ. කුමාර මයා<br>6. ඩබ්. ජී. එස්. එල්. වනිගසේකර මයා<br>7. පී. අබේවර්ධන මයා | මීටර් 1443 | මීටර් 3.66 | බලයලත් මිනින්දෝරු බ්‍රිජට් දන්දෙනිය 2023.03.02 දිනැති අංක 100 දරන පිඹුරුපත. |